**දරුවන් උදෙසා**
**බයිබලයක්**

# යහපත් සමාරිතයා



**ඉදිරිපත් කරන්නා:** Edward Hughes

**නිදර්ශනය කරන්නා:** M. Maillot; Lazarus Alastair Paterson

**සකස්කරන්නා:** Ruth Klassen; Sarah S.

**පරිවර්ථනය කරන්නා**

**නිෂ්පාදනය කරන්නා:** Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.





"ගුරුතුමනි! සදාකාල ජීවනය ලැබීමට මා කුමක් කළ යුතුද?" ඒ ප්‍රශ්නය ඇසූ පුද්ගලයා ජේසුස් වහන්සේ රවටා ගැනීමට උත්සාහ කල නීතිඥයෙක් වූයේය.

"දෙවියන් වහන්සේගේ නීතිය පවසන්නේ කුමක්ද?"

ජේසුස් වහන්සේ ඇසූ සේක.



“දෙවියන් වහන්සේටත් ඔබේ අසල්වැසියාටත් ප්‍රේම කරන ලෙසයැ” යි ඒ මනුෂ්‍යයා පිළිතුරු දුන්නේය. “නමුත් මාගේ අසල්වැසියා කවුරුදැ” යි ඔහු ඇසුවේය.
3
ඒ මනුෂ්‍යයාගේ ප්‍රශ්නයට පිළිතුරු දීමට ජේසුස් වහන්සේ යෙරුසලමේ සිට ජෙරිකෝව දක්වා වූ මාර්ගයේ ගමන් කරන මිනිසෙකු ගැන කතාවක් කී සේක. එම පුද්ගලයා සොරුන්ගේ ප්‍රහාරයට ලක් වූයේය.
4
සොරු ඔවුන්ට හමුවූ සියලු දේ සොරාගත්තෝය. අවාසනාවන්ත මිනිසාගේ ඇඳුම් පවා සොරු ගත්තෝය. ඔවුහු ඔහුට දරුණු ලෙස තුවාල කළ අතර, ඔහුව පාර අයිනේ දමා ගියෝය.
5
අහම්බෙන් එක්තරා පූජකයෙක් ඒ මග ආවේය. නිසැකවම ඔහු තුවාල ලැබූ මිනිසාට උපකාර කරනු ඇත. නැත! ඔහු පාරේ වැටී සිටි මිනිසාගේ ශරීරයෙන් ලේ
ගලනවා දුටු විට පාරේ අනෙක් පැත්තෙන් ගියේය.
6
වැඩි වේලා යන්නට මත්තෙන් ඇසුනු අඩි ශබ්දය තවත් පුද්ගලයෙකුගේ පැමිණීම නිවේදනය කළේය. ඔහු ලෙවීයෙකු වූයේය. ඔහු දේවමාළිගාවේදී පූජකයන්ට උපකාර කළ මිනිසෙකු වූයේය. ඔහු ගොස් තුවාල වූ පුද්ගලයා දෙස බලා,
ඉන්පසු උදව් නොකර ඉවත්ව ගියේය.
7
අවසානයේදී සමාරීය ජාතික මිනිසෙක් පැමිණියේය. යුදෙව්වෝ සමාරිතයන්ට වෛර කළෝය.
8


ජේසුස් වහන්සේගේ කතාවට සවන් දුන් මිනිසුන් සමාරීය ජාතිකයෙකු වීරයා වනු ඇතැයි බලාපොරොත්තු නොවන්නට ඇත. නමුත් ඔහු වීරයෙකු වූයේය. සමාරීය මිනිසා, තුවාල වී සිටි
මිනිසා ගැන සැලකිලිමත් වී උදව් කිරීමට නතර වූයේය.
9
සමාරීය ජාතිකයා දණින් හිඳ ආගන්තුකයාගේ තුවාලවලට මෘදු ලෙස බෙහෙත් දමා වෙළුම් පටි වලින් එතුවේය. ඉන්පසු ඔහු තුවාල වූ මිනිසාට ඔහුගේම කොටළුවා මත නැඟීමට උදව් කළේය.
10
පාර අයිනේ තිබූ තානායමකදී සමාරිතයා මුළු රාත්‍රිය පුරාම ඒ මිනිසා රැකබලා ගත්තේය.
11
උදේ ඔහු, සංචාරකයා නැවත සනීප වන තුරු රැකබලා ගැනීමට තානායම්කරුට මුදල් ගෙවීය.
12
කතාව අවසන් විය. “විපතට පත් මිනිසාට අසල්වැසියා වූයේ කවුද?” ජේසුස් වහන්සේ ඇසූ සේක.
13
“ඔහුට අසල්වැසියා වූයේ දයාව දැක්වූ සමාරීතයායැ” යි නීතිඥවරයා පිළිතුරු දුන්නේය.
14

"යන්න, එසේ ම කරන්නැ" යි ජේසුස් වහන්සේ වදාළ සේක. අසල්වැසියා යනු අවශ්‍යතා ඇති ඕනෑම අයෙකි. අවශ්‍යතා ඇති අයට උපකාර කිරීමෙන් අපට ප්‍රේමය පෙන්විය හැකිවේ. එසේ කිරීමෙන් දෙවියන් වහන්සේ සතුටු වනසේක.



15

යහපත් සමාරිතයා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. ලූක් 10

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130

16




46 60

17

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)

18